# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/12 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

### 1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග

1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 2 වන නියෝගයෙන් ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් කරනු ලැබූ ආඥාව.

වී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1. මේ ආඥාව 1976 අත්‍යවශ්‍ය සේවා ආඥාව නමින් හඳුන්වනු ලැබේ.

2. 1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 2 වෙනි නියෝගයෙහි " අත්‍යවශ්‍ය සේවය " යන පදය විස්තර කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් සේවාවන් මහජන ප්‍රයෝජනය සඳහා බව හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(1) ආහාර හෝ පාන ද්‍රව්‍ය සැපයීම, ආරක්ෂා කිරීම හා බෙදා හැරීම.

(2) ඛනිජ තෙල් නිෂ්පාදන හා ගෑස් ඇතුළු ඉන්ධන සැපයීම හෝ බෙදා හැරීම.

(3) විදුලි බලය සැපයීම.

(4) මගීන් හෝ බඩු සඳහා මහාමාර්ග ගමනාගමන සේවාවන්.

(5) වතුර සැපයීම.

(6) තැපැල්, ටෙලිෆෝන්, විදුලි පණිවුඩ හා ඉවන් විදුලි සේවාවන්.

(7) පහත සඳහන් කරුණු සඳහා කළයුතු යයි අවශ්‍ය හෝ නියමිත කවර අන්දමේ විස්තරයක වුවද සියලු සේවා කාර්ය හෝ වැඩ :—

(අ) (235 වෙනි අධිකාරය වූ) තිරුබදු ආඥාපනතෙහි කාර්යයන් සඳහා විස්තර කරනු ලැබූ පරිදි යම් වරායක් ඇතුළත වූ යාත්‍රාවකින් ආහාර හෝ පාන ද්‍රව්‍ය හෝ රට අඟුරු, තෙල් හෝ ඉන්ධන, බෑම, ගෙනයාම, ගොඩබෑම, ගබඩා කිරීම, බාරදීම හා ඉවත් කිරීම ;

(ආ) තේ, රබර් හෝ පොල් හෝ ඒවායේ නිෂ්පාදන, වගා කිරීම, සෑදීම, නිපදවීම, විකිණීම, නැව්වලට පැටවීම හෝ නැව්වලට පැටවීම සඳහා ගබඩා කිරීම ;

(ඇ) ආණ්ඩුව විසින් හෝ වෙනත් අන්දමකින් පවත්වාගෙන යනු ලබන ආරෝග්‍යශාලාවල, සාත්තු නිවාසවල, ඖෂධ ශාලාවල හා වෙනත් සමාන ආයතනවල ලෙඩුන් භාරගැනීම, බලා ගැනීම, පෝෂණය කිරීම හා ලෙඩුන්ට සාත්තු කිරීම හා ප්‍රතිකාර කිරීම ;

(ඈ) වතුර සැපයීම, විදුලි බලය, (අළුවී ඉවත් කිරීම හා ගෙනයාම ඇතුළුව) කාණු ක්‍රමය හා කසල කාණු ක්‍රමය, ගිනි නිවන සේවා හා ගිලන්රථ සේවා, කසළ ශෝධනය හා කුණු ඉවත් කිරීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් මගින් පවත්වාගෙන යනු ලබන කටයුතු ;

(ඉ) මංමාවත්, පාලම්, බෝක්කු, අහස් යානා තොටුපොළ, වරායවල් හා දුම්රිය මාර්ග ඇතුළු මංමාවත්, දුම්රිය මාර්ග හෝ ඉවන් ගමනාගමන සේවාවන් සඳහා පහසුකම් සැපයීම හා පවත්වාගෙන යාම.

(8) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ එහි යම් අංශයක් විසින් සපයනු ලබන සේවාවන්.

(9) ආණ්ඩුවේ යම් සංස්ථාවක් හෝ එහි යම් අංශයක් විසින් සපයනු ලබන සේවාවන්.

(10) ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව හා වෙළඳ හෝ මුදල් ව්‍යාපාරික කටයුතුවල යෙදුනු අන්කිසි බැංකුවක් විසින් සපයනු ලබන සේවාවන්.

(11) කවර අන්දමේ විස්තරයක වුවද භාණ්ඩ ගෙන්වීමෙ, පිටරට යැවීමෙ, විකිණීමෙ, සැපයීමෙ හෝ බෙදාහැරීමෙ යෙදුනු යම් වෙළඳ හෝ වාණිජ ව්‍යාපාරයක් විසින් සපයනු ලබන සේවාවන්.

(12) සියලුම සමූපකාර සමිති හා සංගම් විසින් සපයනු ලබන සේවාවන්.

(13) පහත සඳහන් කාර්මික නිෂ්පාදන සකස් කිරීම, නිෂ්පාදනය කිරීම හෝ බෙදා හැරීම, හෝ එම නිෂ්පාදන සකස් කිරීම, නිෂ්පාදනය කිරීම හෝ බෙදා හැරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය කිරීම හෝ සැපයීම සම්බන්ධයෙන් කළයුතු යයි අවශ්‍ය හෝ නියමිත කවර අන්දමේ විස්තරයක වුව ද සියලු සේවා, කාර්ය හෝ වැඩ :—

(අ) වියළි පිටි කිරි.

(ආ) කුකුළු සහ සත්ව ආහාර.

(ඇ) අයිස්.

(ඈ) කපු නූල් සහ කපු රෙදි.

(ඉ) වායු මැන්ටල්.

(ඊ) ඇසිටිලීන් වායුව.

(උ) ඔක්සිජන් වායුව.

(ඌ) දල්වන ඉටිපන්දම්.

(එ) ගිනි පෙට්ටි.

(ඒ) භෛෂජ්‍ය ද්‍රව්‍ය හා ඖෂධ.

(ඔ) සබන්.

(ඕ) බහු පටල සහිත කඩදාසි මලු.

(ක) සම්පූර්ණයෙන්ම හෝ අඩ වශයෙන් පොලිතීන් පටලවලින් සාදන බඳුන්.

(ග) වීදුරුවලින් සාදන බෝතල් සහ වෙනත් බඳුන්.

(ච) ඇලුමිනියම් තහඩු හා ලයිනිං.

(ජ) කටු කම්බි.

(ට) කොකු ඇණ.

(ඩ) ටෙලෙක් තහඩුවලින් සාදන බඳුන්.

(ණ) අකුලන නළ.

(ත) තේ පෙට්ටි සඳහා ලෝහමය පටි කිරීම.

(ද) කම්බි ඇණ.

(න) විදුලි බුබුළු.

(ප) බයිසිකල් ටයර් සහ ටියුබ්.

(බ) රබර් ද්‍රාවණ සහ සිමෙන්ති.

(14) පහත සඳහන් කරුණු සඳහා කළ යුතු යයි අවශ්‍ය හෝ නියමිත කවර අන්දමේ විස්තරයක වුවද සියලු සේවා හෝ වැඩ :—

(අ) ඇපරල් එක්ස්පෝර්ට්ස් සමාගම, සීමාසහිත හෙන්ට්ලි ගාමන්ට්ස් සමාගම සහ සීමාසහිත යුනයිටඩ් ගාමන්ට්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් තනා නිමකළ ඇඳුම් ද, සීමාසහිත ලංකා පැන්සල් සමාගම සහ එළිය පැන්සල් සමාගම විසින් පැන්සල් ද, නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, විකිණීම හෝ අපනයනය කිරීම ; සහ

(ආ) ඇපරල් එක්ස්පෝර්ට්ස් සමාගම, සීමාසහිත හෙන්ට්ලි ගාමන්ට්ස් සමාගම සහ සීමා සහිත යුනයිටඩ් ගාමන්ට්ස් ඉන්ටර්නැෂනල් සමාගම විසින් තනා නිමකළ ඇඳුම් ද, සීමාසහිත ලංකා පැන්සල් සමාගම සහ එළිය පැන්සල් සමාගම විසින් පැන්සල් ද, නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය කිරීම හෝ සැපයීම.

3. මෙම ආඥාවේ කාර්යයන් සඳහා—

(i) " පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් කෙරේ.

(ii) " ආණ්ඩුවේ සංස්ථාවක් " යන්නෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් ප්‍රාග්ධනය යොදවනු ලබන සංස්ථාවක් අදහස් කෙරේ.

4. මේ ආඥාව ශ්‍රී ලංකාව මුළුල්ලේම අදාළ විය යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී